# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2208/13 - 2020 දෙසැම්බර් මස 30 වැනි බදාදා - 2020.12.30

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී 4/2013.

**(276 වන අධිකාරය වූ) නීති අධ්‍යාපන සභා ආඥාපනත**

(276 වන අධිකාරය වූ) නීති අධ්‍යාපන සභා ආඥාපනතේ 7 වන වගන්තිය යටතේ අධිකරණ අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව සංස්ථාගත නීති අධ්‍යාපන සභාව විසින් සාදන ලද රීති.

සංස්ථාගත නීති අධ්‍යාපන සභාව සඳහා
සහ ඒ වෙනුවට අත්සන් කරනු ලබන,
සංස්ථාගත නීති අධ්‍යාපන සභාව.

කොළඹ දී ය.

රීති

1. කලින් කලට සංශෝධිත පරිදි වූ (276 වන අධිකාරය වන) නීති අධ්‍යාපන සභා ආඥාපනතේ 7 වන වගන්තිය යටතේ සාදන ලද රීති, පහත දැක්වෙන පරිදි තවදුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

(1) 23 වන රීතිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන රීතිය ආදේශ කිරීමෙන් :-

''23. (1) යම් තැනැත්තකු -

(අ) ශ්‍රී ලංකාවේ පුරවැසියකු වන්නේ නම්,
(ආ) ඉල්ලුම්පත්‍රය ඉදිරිපත් කරන අවස්ථාවේදී වයස අවුරුදු දහහත සම්පූර්ණ කර ඇත්නම් ; සහ
(ඇ) සභාවට පිළිගත හැකි යහපත් චරිතය පිළිබඳ සහතිකයක් ඉදිරිපත් කර ඇත්නම්,

මිස, ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයකු වශයෙන් සුදුසුකම් ලැබීම සඳහා ඔහු ශ්‍රී ලංකා නීති විද්‍යාලය වෙත ඇතුළත් කරගනු නොලැබිය යුතුය.


1A - PG 5266 — 520 (2020/12)


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(2) මේ යටතේ විධිවිධාන සලස්වා ඇති පරිදි ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයන් වශයෙන් සුදුසුකම් ලැබීම සඳහා යම් තැනැත්තන් වෙත හැකියාව ලබාදෙන්නා වූ ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ අධ්‍යයන පාඨමාලාවක් සඳහා සිසුන් ඇතුළත් කර ගැනීමේ කාර්යය පිණිස සභාවේ මගපෙන්වීම යටතේ විභාග දෙපාර්තමේන්තුව විසින් යම් වර්ෂයක් සඳහා, අවස්ථාවෝචිත පරිදි, පොදු ප්‍රවේශ විභාගයක් හෝ විශේෂ ප්‍රවේශ විභාගයක් පවත්වනු ලැබිය යුතු ය.

(3) මේ රීතියේ (1) වන අනු රීතියේ නිශ්චිතව දක්වා ඇති අවශ්‍යතා සපුරාලන යම් තැනැත්තකු,

(අ) (i) ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන ශ්‍රී ලංකා අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී ; හෝ

(ii) එක්සත් රාජධානියේ අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී ; හෝ

(iii) ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් නිර්දේශ කරනු ලබන මේ අනු රීතියේ (අ) ඡේදයේ (i) හෝ (ii) අනුඡේදවල සඳහන් උසස් පෙළ මට්ටමේ සුදුසුකමක් ලෙස පිළිගනු ලබන නිර්ණායක තුළට ගැනෙන යම් විභාගයක දී,

එකවර සම්මාන සාමාර්ථ දෙකක් සහ එක් සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබීමේ සුදුසුකමින් යුක්ත වේ නම් ; සහ

(ආ) ශ්‍රී ලංකා අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී හෝ ජාතික අධ්‍යයන පොදු සහතික පත්‍ර විභාගයේදී හෝ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් ඉහත විභාගවලට සමාන යැයි පිළිගනු ලබන විභාගයකදී ඉංග්‍රීසි භාෂාව සඳහා සම්මාන සාමාර්ථයක් ද සිංහල හෝ දෙමළ භාෂාව සඳහා සම්මාන සාමාර්ථයක් ද ලබා ඇත්නම්,

යම් වර්ෂයක් සඳහා පවත්වනු ලබන පොදු ප්‍රවේශ විභාගයට පෙනී සිටීම සඳහා ශ්‍රී ලංකා නීති විද්‍යාලය වෙත ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කිරීමට එකී තැනැත්තා සුදුසුකම් ලැබිය යුතුය.

(4) (අ) (1) වන හා (3) වන අනු රීති යටතේ සුදුසුකම් ලබන සහ තත්කාලයේ පවත්වනු ලබන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ Z - ලකුණු හෝ වෙනත් නිර්ණායක හෝ මත පදනම්ව විශ්වවිද්‍යාල ප්‍රවේශය නිශ්චය කරනු ලබන්නාවූ ද, 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත යටතේ පිහිටුවන ලද හෝ පිහිටුවනු ලැබූ බවට සලකනු ලබන්නා වූ ද යම් විශ්වවිද්‍යාලයකින් නීතිවේදී උපාධිය (එල්.එල්.බී) ලබා ඇති යම් තැනැත්තකු, ශ්‍රී ලංකා නීති විද්‍යාලය විසින් පවත්වනු ලබන පොදු සහ විශේෂ ප්‍රවේශ විභාගවලින් සහ ප්‍රථම වසර සහ දෙවන වසර විභාගවලින් නිදහස් කරනු ලැබිය යුතු අතර, ඔහු ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයකු වශයෙන් සුදුසුකම් ලැබීම සඳහා ශ්‍රී ලංකා නීති විද්‍යාලය විසින් පවත්වනු ලබන අවසාන වසර විභාගය සඳහා පෙනීසිටීම පිණිස ශ්‍රී ලංකා නීති විද්‍යාලයට සෘජුවම ඇතුළත් කරගනු ලැබිය යුතුය.

(ආ) (1) වන සහ (3) වන අනු රීති යටතේ සුදුසුකම් ලබන සහ ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයෙන් හෝ කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයෙන් නීතිවේදී උපාධිය (එල්.එල්.බී) ලබා ඇති යම් තැනැත්තකු විසින්, සභාවේ අභිමතය මත, මේ අනු රීතියේ (අ) ඡේදයේ සඳහන් නිදහස් කිරීමට හෝ 75(2)(අ) රීතියේ සඳහන් නිදහස් කිරීමට හෝ හිමිකම් ලැබිය යුතු ය. සභාව විසින්, (5) වන අනු රීතියේ විධිවිධානවලට යටත්ව, කලින් කලට, එවැනි නිදහස් කිරීමක් ප්‍රදානය කිරීම පිළිබඳ සිය තීරණය සමාලෝචනය කරනු ලැබිය හැකි ය.

(5) (4) වන අනු රීතියේ (ආ) ඡේදය යටතේ ප්‍රදානය කරන ලද නිදහස් කිරීම සඳහා නියමිත ප්‍රමිතීන් ඇතිකර පවත්වාගෙන යාමට අවශ්‍ය කරනු ලැබිය හැකි කොන්දේසි නියම කරමින් සභාව විසින්, කලින් කලට, අවස්ථාවෝචිත පරිදි, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය වෙත හෝ කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය වෙත විධාන නිකුත් කරනු ලැබිය හැකි ය.

(6) (1) වන සහ (3) වන අනුරීති යටතේ සුදුසුකම් ලබන සහ පහත දක්වෙන උපාධි ප්‍රදානය කිරීමේ ආයතනවලින් නීතිවේදී උපාධිය (එල්.එල්.බී.) ලබාගෙන ඇති යම් තැනැත්තකු විසින්, මේ රීතියේ (2) වන අනු රීතියේ සඳහන් විශේෂ ප්‍රවේශ විභාගයට පෙනී සිට එය සමත් වී ඇත්නම් ඔහු ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයකු වශයෙන් සුදුසුකම් ලැබීම සඳහා ශ්‍රී ලංකා නීති විද්‍යාලයට ඇතුළත් වීම පිණිස සුදුසුකම් ලැබිය හැකි ය :

(අ) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25අ වගන්තිය යටතේ ශ්‍රී ලංකාවේ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් පිළිගනු ලබන යම් ආයතනයක් ; හෝ

(ආ) සභාව විසින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි යම් නිර්ණායකයන්ට අනුකූලව යම් ආයතන හඳුනාගැනීම සඳහා ඇගයීමක් සිදු කිරීමෙන් පසුව එසේ සභාව විසින් පිළිගනු ලබන යම් ආයතනයක්.

(7) (1) වන සහ (3) වන අනු රීති යටතේ සුදුසුකම් ලබන සහ ශ්‍රී ලංකාවෙන් පිටත පිහිටා ඇති විශ්වවිද්‍යාලයකින්, එනම් -

(අ) එක්සත් ජනපදය, එක්සත් රාජධානිය, කැනඩාව, ඕස්ට්‍රේලියාව, සිංගප්පූරුව, නවසීලන්තය යන රටවල පිළිගත් විශ්වවිද්‍යාලයක් ; හෝ

(ආ) යම් උපාධිධරයකු අධ්‍යාපනය ලබන කාල සීමාවේදී යම් එක් වර්ෂයක් තුළ අවස්ථාවෝචිත, ක්වැක්කොරලි සයිමන්ඩ් (Quacquareli Symond) (QS) ලෝක විශ්වවිද්‍යාල ශ්‍රේණිගත කිරීම අනුව හෝ සභාව විසින් පිළිගනු ලබන වෙනත් යම් ශ්‍රේණිගත කිරීමක් ප්‍රකාරව නීති අංශයෙන් ඉහළම විශ්වවිද්‍යාල සියය (100) අතරට ගැනෙන විශ්වවිද්‍යාලයක්,

වන්නාවූ ද, එවැනි විශ්වවිද්‍යාල පිළිගනු ලැබීම සඳහා සභාව විසින් නිශ්චිතව දක්වන ලද නිර්ණායකයන්ට අනුකූලව සභාව විසින් කලින් කලට ඇගයීමට ලක් කරනු ලබන හා පිළිගනු ලබන්නා වූ ද, යම් විශ්වවිද්‍යාලයක නීතිවේදී උපාධිය (එල්.එල්.බී.) ලබාගෙන ඇති යම් තැනැත්තකු විසින්, විශේෂ ප්‍රවේශ විභාගය සඳහා පෙනී සිට එය සමත් වී ඇත්නම්, ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයකු වශයෙන් සුදුසුකම් ලැබීම සඳහා ශ්‍රී ලංකා නීති විද්‍යාලයට ඇතුළත් වීම පිණිස සුදුසුකම් ලැබිය හැකි ය ඃ

එසේ වුවද යම් තැනැත්තකු විසින් (අ) හෝ (ආ) ඡේදයේ සඳහන් විශ්වවිද්‍යාලයකින් නීතිවේදී උපාධියක් (එල්.එල්.බී) ලබාගෙන ඇති අවස්ථාවක දී. එකී විශ්වවිද්‍යාලවලින් ප්‍රදානය කරනු ලබන උපාධිය සුදුසුකම් ලැබීමේ නීති උපාධියක් (QLD) වේ නම් හෝ එම උපාධිධරයාට නීතිඥ වෘත්තියට ඇතුල්වීමට සහ අදාළ අධිකරණ බලප්‍රදේශයෙහි නීතිඥවරයකු වශයෙන් වෘත්තියේ නියැලීමට හැකියාව ලබා දෙන උපාධියක් වේ නම් හෝ පමණක්, මේ රීතියේ (2) වන අනු රීතියේ සඳහන් විශේෂ ප්‍රවේශ විභාගය සඳහා පෙනී සිටීමට එකී තැනැත්තාට අවසර ලබා දිය යුතු ය.

(8) (2) වන අනු රීතියේ සඳහන් ප්‍රවේශ විභාගවලින් සාර්ථකත්වයට පත් ව, එකී ප්‍රවේශ විභාගවල ඔවුන්ගේ කාර්ය සාධනය මත පදනම් වූ කුසලතා අනුපිළිවෙල අනුව සහ සභාව විසින්, කලින් කලට නිශ්චය කරනු ලබන පුරප්පාඩු සංඛ්‍යාව මත, සභාව විසින් එක් එක් අධ්‍යයන වර්ෂයට අදාළව ශ්‍රී ලංකා නීති විද්‍යාලයට ඇතුළත් කරගනු ලැබිය යුතු සිසුන්ගේ ප්‍රතිශතය හෝ සිසුන් ප්‍රමාණය නිශ්චය කරනු ලැබිය යුතු ය ඃ

එසේ වුව ද, (10) වන අනු රීතියේ සඳහන් ප්‍රශ්න පත්‍ර දෙකට අදාළව, එක් එක් ප්‍රශ්න පත්‍රය සම්බන්ධයෙන් කවර හෝ එක් ප්‍රශ්න පත්‍රයක් සඳහා සියයට පනහකට වඩා අඩු ලකුණු ප්‍රමාණයක් ලබාගෙන ඇති අපේක්ෂකයකු, ප්‍රවේශය සඳහා තෝරාගනු නොලැබිය යුතු ය.

(9) පොදු ප්‍රවේශ විභාගය හෝ විශේෂ ප්‍රවේශ විභාගය සඳහා පෙනී සිටීමට ඉල්ලුම්කර ඇති සෑම ඉල්ලුම්පත්‍රයක්ම, එකී කාර්යය සඳහා සභාව විසින් නිශ්චය කරනු ලැබිය යුතු ආකෘතියෙන් ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එකී සෑම ඉල්ලුම්පත්‍රයක් ම ඉල්ලුම්පත්‍ර භාරගන්නා අවසාන දිනය ලෙස සභාව විසින් නිශ්චය කරනු ලබන දින හෝ එදිනට පෙර, සභාව විසින් නිශ්චය කරනු ලබන ගාස්තුව ගෙවීම සනාථ කෙරෙන රිසිට් පතක් සමග ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එම ගාස්තුව කවර අවස්ථාවකදී හෝ ආපසු ගෙවනු නොලැබිය යුතු ය.

(10) (අ) (2) වන අනු රීතියේ සඳහන් පොදු ප්‍රවේශ විභාගය සඳහා පෙනී සිටින යම් අපේක්ෂකයකු -

(i) අවස්ථාවෝචිත පරිදි, සිංහල භාෂාව හෝ දෙමළ භාෂාව හෝ ඉංග්‍රීසි භාෂාව ; සහ

(ii) සාමාන්‍ය දැනීම සහ සාමාන්‍ය බුද්ධිය.

යන ලිඛිත ප්‍රශ්න පත්‍ර සඳහා පෙනී සිට ඒවායින් සමත්විය යුතු ය.

(ආ) මේ අනු රීතියේ (අ) ඡේදයේ (ii) වන අනු ඡේදයේ සඳහන් සාමාන්‍ය දැනීම සහ සාමාන්‍ය බුද්ධිය යන ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම සඳහා යම් ඉල්ලුම්කරුවකු විසින් සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි මාධ්‍යය තෝරාගනු ලැබිය හැකි ය. ඔහු විසින් සාමාන්‍ය දැනීම සහ සාමාන්‍ය බුද්ධිය යන ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම සඳහා සිංහල මාධ්‍යය හෝ දෙමළ මාධ්‍යය තෝරාගනු ලබන්නේ නම්, මේ අනු රීතියේ (අ) ඡේදයේ (i) වන අනු ඡේදයේ සඳහන් ඉංග්‍රීසි භාෂාව ප්‍රශ්න පත්‍රයට පෙනී සිටීම ඔහුට නියම කරනු ලැබිය යුතු ය. ඔහු විසින් සාමාන්‍ය දැනීම සහ සාමාන්‍ය බුද්ධිය යන ප්‍රශ්නපත්‍රයට ඉංග්‍රීසි භාෂාවෙන් පිළිතුරු සැපයීම තෝරාගනු ලබන්නේ නම්, සිංහල භාෂාව හෝ දෙමළ භාෂාව ප්‍රශ්න පත්‍රයට පෙනී සිටීම සඳහා ඔහුට නියම කරනු ලැබිය යුතු ය.

(ඈ) යම් අධ්‍යයන වර්ෂයක් සඳහා ප්‍රවේශය සඳහා වන පොදු ප්‍රවේශ විභාගය, ප්‍රායෝගිකව හැකිතාක් දුරට, ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ විදුහල්පතිවරයා විසින් නියම කරනු ලැබිය හැකි එකී අධ්‍යයන වර්ෂයට පෙරාතුවම වූ ජුනි මාසයේ දී පවත්වනු ලැබිය යුතු ය.

(ඇ) (i) අපේක්ෂකයා සතු චින්තන, ප්‍රකාශන සහ සංවිධාන ශක්තිය පරීක්ෂා කිරීම ප්‍රධාන අරමුණ වනු ලබන, රචනාව ;

(ii) සාරාංශකරණය, භාවිතාර්ථය දැක්වීම ;

(iii) පද වින්‍යාසය, වාග් මාලාව, සමාන පද සහ විරුද්ධ පද, රූපක හා වාග් සම්ප්‍රදායානුකූලව භාවිතයන්.

පොදු ප්‍රවේශ විභාගයේ දී භාෂා ප්‍රශ්න පත්‍රය සඳහා වන විෂයය නිර්දේශය විය යුතු ය.

(ඉ) ඉහත සඳහන් විභාගයේදී එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම සඳහා වෙන් කරන ලද කාලය පැය තුනක් විය යුතු ය.

(11) (I) වන අනු රීතියේ පටහැනිව කුමක් සඳහන් වුව ද, යම් තැනැත්තකු විසින්, රැකියාවක නිරතවීමේ හේතුවෙන් හෝ අන්‍යාකාරයෙන්, 21 වන රීතිය මගින් නියම කර ඇති පරිදි දේශනවලට සහභාගිවීමට ඔහුට නොහැකි වන බව හෝ ආධුනිකත්ව කාලසීමාව සම්බන්ධයෙන් 36 වන රීතියේ විධිවිධානයන්ට අනුකූලව ක්‍රියා කිරීමේ හැකියාවක් නොමැති බව පෙනී යන අවස්ථාවකදී. එකී තැනැත්තා, ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයකු වශයෙන් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඇතුළත් කරගනු නොලැබිය යුතු ය.

(12) පහත දැක්වෙන විධිවිධාන, විශේෂ ප්‍රවේශ විභාගය සම්බන්ධයෙන් අදාළ විය යුතු ය ඃ

(අ) (6) වන සහ (7) වන අනු රීතිවල සඳහන් යම් උපාධිධරයකු හට සභාවේ මෙහෙයවීම යටතේ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන විශේෂ ප්‍රවේශ විභාගය සඳහා පෙනී සිටීමට නියම කරනු ලැබිය යුතු ය. සභාව විසින්, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන එම විශේෂ ප්‍රවේශ විභාගයට අදාළ විෂය මාලාව සහ වෙනත් අදාළ සාධක සම්බන්ධයෙන් සැලසුම් කිරීම පිණිස, (ආ) ඡේදයේ සඳහන් අදාළ විෂයයන් පිළිබඳව ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ ආචාර්ය මණ්ඩලයක් කලින් කලට පත් කරනු ලැබිය යුතු ය.

(ආ) සභාව විසින්, කලින් කලට, එම විශේෂ ප්‍රවේශ විභාගයේ දී යම් අපේක්ෂකයකු පරීක්ෂා කරනු ලබන නීති විෂයයන් පිළිබඳව නිශ්චය කරනු ලැබිය යුතු ය.

(ඇ) යම් අපේක්ෂකයකු ශ්‍රී ලංකා නීති විද්‍යාලයට ඇතුළත් කරගනු ලැබීම සඳහා තෝරා ගනු ලැබීම පිණිස ඔහු විසින් අදාළ කඩඉම් ලකුණු ලබා තිබිය යුතු අතර, එම විශේෂ ප්‍රවේශ විභාගයේ දී ලබාගත් ලකුණු සහ සභාව විසින්, කලින් කලට නිශ්චය කරනු ලබන පවතින පුරප්පාඩු සංඛ්‍යාව මත පදනම්ව කුසලතා අනුපිළිවෙළ අනුව තෝරා ගනු ලැබිය යුතු ය ඃ

එසේ වුවද, තෝරාගනු ලැබිය යුතු අපේක්ෂකයන් සංඛ්‍යාව. ප්‍රායෝගිකව හැකිතාක් දුරට, (2) වන අනු රීතියේ සඳහන් පොදු ප්‍රවේශ විභාගය යටතේ ශ්‍රී ලංකා නීති විද්‍යාලයට ඇතුළත් කරගනු ලබන සංඛ්‍යාව නොඉක්මවිය යුතු ය ;

(ඈ) විශේෂ ප්‍රවේශ විභාගය සභාව විසින් නිශ්චය කරනු ලබන පරිදි ශ්‍රී ලංකා නීති විද්‍යාලයට ප්‍රවේශ වන වර්ෂයට පෙරාතුව වූ වර්ෂයේ යම් නිශ්චිත මාසයක් තුළ, පවත්වනු ලැබිය යුතු ය.

(2) 28 වන රීතියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් රීතිය ඇතුළත් කිරීමෙන් ඃ

"28 අ. (1) ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ පවත්වනු ලබන සියලු පාඨමාලා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පවත්වනු ලැබිය යුතු ය.

(2) විභාග පිළිබඳ අනිවාර්ය මාධ්‍ය ඉංග්‍රීසි විය යුතු අතර එය පහත දැක්වෙන පරිදි හඳුන්වා දෙනු ලැබිය යුතු යඃ

(අ) 2022 වර්ෂයෙන් ආරම්භව, පළමු වසර - අවම වශයෙන් විෂයයන් තුනකට (3) ඉංග්‍රීසි මාධ්‍යයෙන් පිළිතුරු සැපයිය යුතුය ;

(ආ) 2023 වර්ෂයෙන් ආරම්භව, දෙවන වසර - අවම වශයෙන් විෂයයන් පහකට (5) ඉංග්‍රීසි මාධ්‍යයෙන් පිළිතුරු සැපයිය යුතු ය ;

(ඇ) 2024 වර්ෂයෙන් ආරම්භව, අවසන් වසර - සියලු විෂයයන් සඳහා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පිළිතුරු සැපයිය යුතු ය.

(3) සභාව විසින්, 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත යටතේ පිහිටුවන ලද හෝ පිහිටුවනු ලැබූ බවට සලකනු ලබන යම් විශ්වවිද්‍යාලයක, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ හෝ කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ ඉගැන්වීම් මාධ්‍ය සැලකිල්ලට ගෙන, තම අභිමතය පරිදි මේ රීතිය 2025 වර්ෂය තෙක් අදාළ වීමෙන් එකී යම් විශ්වවිද්‍යාලයක නීතිවේදී උපාධිය (එල්.එල්.බී) ලබා ඇති යම් තැනැත්තකු නිදහස් කළ හැකිය."

(3) එහි 30 වන රීතියෙහි "යම් ලිඛිත නීතියක් මගින් හෝ යම් ලිඛිත නීතියක් යටතේ පිහිටුවනු ලැබූ හෝ පිහිටුවනු ලැබූ බවට සලකනු ලබන සහ 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත ක්‍රියාත්මක වන දිනට පෙරාතුවම වූ දිනයේ දී පැවැති ලංකාවේ විශ්වවිද්‍යාලයක" යන වචන වෙනුවට "විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් තත්කාලයේ පිළිගනු ලබන අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ Z-ලකුණු හෝ වෙනත් නිර්ණායක හෝ මත පදනම්ව විශ්වවිද්‍යාල ප්‍රවේශය නිශ්චය කරනු ලබන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත යටතේ පිහිටුවන ලද හෝ පිහිටුවනු ලැබූ බවට සලකනු ලබන යම් විශ්වවිද්‍යාලයක" යන වචන ආදේශ කිරීමෙන් ;

(4) එහි 31 වන රීතියෙහි "ලංකාවේ විශ්වවිද්‍යාලයක" වන වචන වෙනුවට "විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් තත්කාලයේ පිළිගනු ලබන අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ Z- ලකුණු හෝ වෙනත් නිර්ණායක හෝ මත පදනම්ව විශ්වවිද්‍යාල ප්‍රවේශය නිශ්චය කරනු ලබන, 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත යටතේ පිහිටුවන ලද හෝ පිහිටුවන ලද බවට සලකනු ලබන යම් විශ්වවිද්‍යාලයක" යන වචන ආදේශ කිරීමෙන් ;

(5) එහි 32 වන රීතියෙහි, (අ) ඡේදය ඉවත් කිරීමෙන් ;

(6) එහි 32 වන රීතියට ඉක්බිතිව ම පහත දැක්වෙන 32අ අලුත් රීතිය ඇතුළත් කිරීමෙන් ඃ

"32 අ. 30, 31 සහ 32 වන රීතිවල පටහැනිව කුමක් සඳහන් වුව ද, 23(2) සහ 23(12) රීතිවල සඳහන් විශේෂ ප්‍රවේශ විභාගයෙන් සාර්ථකත්වයට පත්වූ, 23 වන රීතියේ (6) සහ (7) වන අනුරීතිවල සඳහන් යම් උපාධිධරයකු ශ්‍රී ලංකා නීති විද්‍යාලයට ඇතුළත් වීමෙන් පසු යම් ඕනෑම අවස්ථාවකදී, ගෙවනු ලැබිය යුතු සියලු ගාස්තු ගෙවීමෙන් පසුව සභාව විසින් නිශ්චය කරනු ලබන වෙනත් අදාළ කොන්දේසිවලට යටත්ව, අවසාන වසර විභාගය සඳහා ඇතුළත් කරගනු ලැබිය හැකි ය" ;

(7) එහි 51 වන රීතියෙහි, "23 (1) ඉ රීතියේ" යන වචන වෙනුවට "23 වන රීතියේ (3) (ආ) අනුරීතියේ" යන වචන ආදේශ කිරීමෙන් ;

(8) 75 වන රීතිය පහත දැක්වෙන පරිදි සංශෝධනය කිරීමෙන් ඃ-

(අ) එහි (1) (අ) අනු රීතියේ "යම් ලිඛිත නීතියක් මගින් හෝ යම් ලිඛිත නීතියක් යටතේ පිහිටුවනු ලැබූ හෝ පිහිටුවනු ලැබූ බවට සලකනු ලබන සහ 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත ක්‍රියාත්මක වන දිනට පෙරාතුව ම වූ දිනයේ දී පැවති ලංකාවේ විශ්වවිද්‍යාලයක හෝ කොළඹ ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලයේ" යන වචන වෙනුවට "විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් තත් කාලයේ පිළිගනු ලබන අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ Z-ලකුණු හෝ වෙනත් යම් නිර්ණායක හෝ මත පදනම්ව විශ්වවිද්‍යාල ප්‍රවේශය නිශ්චය කරනු ලබන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත යටතේ පිහිටුවන ලද හෝ පිහිටුවනු ලැබූ බවට සලකනු ලබන යම් විශ්වවිද්‍යාලයක" යන වචන ආදේශ කිරීමෙන් ;

(ආ) එහි (2) (අ) අනු රීතියේ "ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලයේ හෝ විවෘත විශ්වවිද්‍යාලයේ නීති පීඨයේ උපාධිධරයකු" යන වචන වෙනුවට "23 වන රීතියේ (4) (ආ) සහ (5) අනු රීතින්හි විධිවිධානයන්ට යටත්ව, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ හෝ කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ නීති පීඨයේ උපාධිධරයකු" යන වචන ආදේශ කිරීමෙන් ;

(ඇ) එහි (2) (ආ) අනු රීතියේ "ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලයේ හෝ ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ" යන වචන වෙනුවට "විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් තත් කාලයේ පිළිගනු ලබන අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ Z-ලකුණු හෝ වෙනත් නිර්ණායක හෝ මත පදනම්ව විශ්වවිද්‍යාල ප්‍රවේශය නිශ්චය කරනු ලබන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත යටතේ පිහිටුවන ලද හෝ පිහිටුවනු ලැබූ බවට සලකනු ලබන යම් විශ්වවිද්‍යාලයක හෝ ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ හෝ කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ" යන වචන ආදේශ කිරීමෙන් ;

(ඇ) එහි (2) (ඇ) අනු රීතියේ "ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලයේ" යන වචන වෙනුවට "විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් තත් කාලයේ පිළිගනු ලබන අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ Z-ලකුණු හෝ වෙනත් නිර්ණායක හෝ මත පදනම්ව විශ්වවිද්‍යාල ප්‍රවේශය නිශ්චය කරනු ලබන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත යටතේ පිහිටුවන ලද හෝ පිහිටුවනු ලැබූ බවට සලකනු ලබන යම් විශ්වවිද්‍යාලයක" යන වචන ආදේශ කිරීමෙන් ;

(ඉ) "ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලය" යන අර්ථ නිරූපණය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අර්ථ නිරූපණ ආදේශ කිරීමෙන් :

"මේ රීතින් හි-

"කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය" යන්නෙන් 1981 අංක 68 දරන සර් ජෝන් කොතලාවල ආරක්ෂක විද්‍යායතන පනතේ 2 වන වගන්තිය යටතේ පිහිටුවන ලද සර් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය අදහස් වේ ;

"විවෘත විශ්වවිද්‍යාලය හෝ ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය" යන්නෙන් 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 23 වන වගන්තිය යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය අදහස් වේ ;

"සුදුසුකම් ලැබීමේ නීති උපාධිය (QLD)" යන්නෙන් "නීති වෘත්තියට ප්‍රවේශ වීම සඳහා සහ අදාළ අධිකරණ කලාපය තුළ නීතිඥවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීම සඳහා වන නීති විභාග සඳහා ප්‍රවේශවීමේ සුදුසුකමක් අදහස් වේ.

(9) II වන උපලේඛනය පහත දැක්වෙන පරිදි සංශෝධනය කිරීමෙන් :

(අ) නියම කර ඇති ආකෘති පත්‍රය වෙනුවට ඇති "අ" ආකෘතියේ විකල්ප ආකෘති පත්‍රවල "(කොළඹ විශ්වවිද්‍යාලය/ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය)" යන වචන වෙනුවට "(අදාළ විශ්වවිද්‍යාලයේ නම)" යන වචන ආදේශ කිරීමෙන් ;

(ආ) නියම කර ඇති ආකෘති පත්‍රය වෙනුවට ඇති "ආ" ආකෘතියේ විකල්ප ආකෘති පත්‍රවල "(කොළඹ විශ්වවිද්‍යාලය/ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය)" යන වචන වෙනුවට "(අදාළ විශ්වවිද්‍යාලයේ නම)" යන වචන ආදේශ කිරීමෙන්.

(10) එහි IV වන උපලේඛනය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපලේඛනය ආදේශ කිරීමෙන් :

**IV වන උපලේඛනය**

**ශිෂ්‍ය ගාස්තු 2021**

| | |
|---|---|
| **ප්‍රවේශ විභාග ගාස්තු** | **රු. 6,000.00** |
| **අයදුම්පත් ගාස්තු**<br>(නීතිවේදී උපාධිය - විවෘත විශ්වවිද්‍යාලය/ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලය, විදේශීය නීතිවේදී උපාධිය සහ වෙනත්) | **රු. 1,000.00** |
| **ඇතුළත්වීමේ ගාස්තු** | **රු. 1,500.00** |
| **ලියාපදිංචි ගාස්තු - පළමු වසර** | |
| ● දේශන ගාස්තු | රු. 3,900.00 |
| ● පුස්තකාල ගාස්තු | රු. 2,600.00 |
| ● ප්‍රලේඛන ගාස්තු | රු. 2,600.00 |
| ● උපයෝගිතා/පහසුකම් ගාස්තු | රු. 5,000.00 |
| ● අදාළ බලධාරීන් සමග අධ්‍යාපන සහතික තහවුරු කිරීම | රු. 2,000.00 |
| ● හැඳුනුම්පත | රු. 800.00 |
| ● ශිෂ්‍ය සමිති ගාස්තු | රු. 500.00 |
| **එකතුව** | **ර.17,400.00** |

| | |
|---|---|
| **ලියාපදිංචි ගාස්තු - දෙවන වසර** | |
| ● දේශන ගාස්තු | රු. 6,900.00 |
| ● පුස්තකාල ගාස්තු | රු. 2,600.00 |
| ● උපයෝගිතා/පහසුකම් ගාස්තු | රු. 5,000.00 |
| ● ශිෂ්‍ය සමිති ගාස්තු | රු. 500.00 |
| **එකතුව** | **රු. 15,000.00** |
| **ලියාපදිංචි ගාස්තු - තෙවන වසර** | |
| ● දේශන ගාස්තු | රු. 9,900.00 |
| ● පුස්තකාල ගාස්තු | රු. 2,600.00 |
| ● උපයෝගිතා/පහසුකම් ගාස්තු | ර. 5,000.00 |
| ● ශිෂ්‍ය සමිති ගාස්තු | රු. 500.00 |
| ● ඔප්පු පොත සහ අධිකරණ සංචාර වාර්තා පරීක්ෂා කිරීම | රු. 1,500.00 |
| **එකතුව** | **රු. 19,500.00** |
| ප්‍රමාද - ලියාපදිංචි ගාස්තු | රු. 2,000.00 |
| ලියාපදිංචිය අළුත් කිරීමේ ගාස්තු | රු. 2,500.00 |
| විභාග ගාස්තු - එක් ප්‍රශ්න පත්‍රයක් සඳහා | රු. 1,000.00 |
| ප්‍රමාද ගාස්තු - විභාග ලියාපදිංචිය | රු. 1,000.00 |
| නොතාරිස් විභාග ගාස්තු - එක් ප්‍රශ්න පත්‍රයක් සඳහා | රු. 2,750.00 |
| විභාගයෙන් ඉවත් වීමේ ගාස්තු | |
| වෛද්‍ය සහතික සහ මානුෂීය හේතු මත පදනම්ව | රු. 500.00 |
| විභාගයෙන් ඉවත් වීමේ ගාස්තු | |
| වෛද්‍ය සහතික සහ මානුෂීය හේතු මත පදනම් නොවූ | රු. 1,000.00 |
| ඊළඟ විභාගය සඳහා අයදුම් කරන විට සිසුන් සම්පූර්ණ විභාග ගාස්තුව ගෙවිය යුතුය. විභාග ගාස්තු ආපසු ගෙවීමක් හෝ ඉදිරියට ගෙන යාමක් නොමැත. (වෛද්‍ය සහ මානුෂීය හේතු මත පදනම් වූ අව්‍යාජ හේතු ඇති සිසුන් පමණක් නිදහස් කළ යුතු ය.) | |
| පුස්තකාල සාමාජිකත්ව ගාස්තු | රු. 500.00 |
| සවිස්තරාත්මක පිටපත් තහවුරු කිරීම | රු. 2,000.00 |
| ශිෂ්‍යභාවය තහවුරු කිරීම සහ වීසා ලිපිය හෝ වෙනත් එවැනි ලිපි | රු. 500.00 |
| ප්‍රායෝගික පුහුණු පාඨමාලාව සඳහා ගාස්තු | රු. 6,000.00 |

2. මෙම සංශෝධිත රීති මගින් සංශෝධිත 23 (1) සහ 23 (3) වන රීති යටතේ ශ්‍රී ලංකා නීති විද්‍යාලය වෙත සාමාන්‍ය ප්‍රවේශය සඳහා වන මූලික ප්‍රවේශ නිර්ණායකය, 2022 වර්ෂයේ ප්‍රවේශය සඳහා 2021 වර්ෂයේ දී පැවැත්වීමට නියමිත සාමාන්‍ය ප්‍රවේශ විභාගය සමගින් ක්‍රියාත්මක විය යුතු ය.

3. අන්තර්කාලීන විධිවිධාන

(අ) මෙම සංශෝධිත රීති ක්‍රියාත්මක වන දිනට පෙරාතුවම සභාව විසින් පිළිගනු ලබන යම් විශ්වවිද්‍යාලයක නීතිවේදී උපාධිය (එල්.එල්.බී) සඳහා බඳවා ගනු ලැබූ හෝ නීතිවේදී උපාධිය ලබාගැනීම සඳහා අධ්‍යයන පාඨමාලාවක් හදාරනු

ලබන යම් ශිෂ්‍යයකු හට එම අධ්‍යයන පාඨමාලාව සම්පූර්ණ කර, 23 (2) වන රීතියේ සඳහන් විශේෂ ප්‍රවේශ විභාගය සඳහා පෙනී නොසිට ශ්‍රී ලංකා නීති විද්‍යාලයට ප්‍රවේශ වීම සඳහා ඉඩ ලබා දිය යුතු ය. එසේ වුව ද, එම ශිෂ්‍යයා විසින්, 2025 අධ්‍යයන වර්ෂය අවසන් වන දින හෝ ඊට පෙර ඔහුගේ නීතිවේදී උපාධිය (එල්.එල්.බී) සම්පූර්ණ කළ යුතු ය.

(ආ) (ආ) ඡේදයේ සලසා ඇති ප්‍රතිලාභය, යම් විශ්වවිද්‍යාලයක් සඳහා අධ්‍යයන පාඨමාලා පවත්වනු ලබන යම් ආයතනයක් නොවන සහ සභාව විසින් පිළිගනු ලබන යම් විශ්වවිද්‍යාලයක නීතිවේදී උපාධිය (එල්.එල්.බී) ලබාගැනීම සඳහා යම් අධ්‍යයන පාඨමාලාවකට බඳවා ගනු ලැබ ඇති බවට සභාව සෑහීමට පත් කිරීම සඳහා සාක්ෂි ඉදිරිපත් කරනු ලබන යම් ශිෂ්‍යයකු වෙත ලබා දිය යුතු ය.

(ඇ) මේ සංශෝධිත රීති ක්‍රියාත්මක වන්නා වූ දින හෝ ඉන්පසු නීතිවේදී උපාධිය (එල්.එල්.බී.) ලබා ගැනීම සඳහා යම් අධ්‍යයන පාඨමාලාවක් හදාරනු ලබන ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ හෝ කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ යම් උපාධිධරයකු, ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ 2025 අධ්‍යයන වර්ෂය අවසන් වන දින හෝ ඊට පෙර ඔහුගේ නීතිවේදී උපාධිය (එල්.එල්.බී) ලබා තිබේ නම්, 23 (3) වන රීතිය ප්‍රකාරව සම්මාන සාමාර්ථ දෙකක් සහ එක් සාමාන්‍ය සාමාර්ථයක් යන අවශ්‍යතාවයෙන් තොරව ශ්‍රී ලංකා නීති විද්‍යාලයට ඇතුළත් වීම සඳහා හිමිකම් ලැබිය යුතු ය.

4. 51 වන රීතියෙහි සඳහන් නිදහස් කිරීම්, බැරිස්ටර් විභාගය සම්පූර්ණ කර ඇති මේ සංශෝධිත රීති ක්‍රියාත්මක වන දින එංගලන්තයේ, ස්කොට්ලන්තයේ හෝ අයර්ලන්තයේ නීති වෘත්තිය සඳහා කැඳවා ඇති යම් අයදුම්කරුවෙකු වෙත අදාළ විය යුතු ය.

01 - 559

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.